# 3 පාඩම ශ්‍රී ලංකාවේ භූ දර්ශනය

■ අ කොටසේ ඇති වගන්තිවලට ගැළපෙන නිවරැදි පිළිතුර ඉ කොටසෙන් තෝරා යා කරන්න

| අ කොටස | ඉ කොටස |
| --- | --- |
| 1. මුහුදු මට්ටමේ සිට මීටර 300ට වඩා උසය | යාපන අර්ධද්වීපය |
| 2. ශේෂ කඳු | වෙරළාශ්‍රිත භූ දර්ශන |
| 3. අධික ජනසංඛ්‍යාව | කඳුකර භූ දර්ශනය |
| 4. කඩොලාන ශාක | තෙත් කලාපීය භූ දර්ශනය |
| 5. නාගදීපය | වියළි කලාපීය භූ දර්ශනය |

■ පහත සඳහන් ප්‍රකාශ හරි නම් හරි ලකුණද වැරදි නම් වැරදි ලකුණද යොදන්න

6. සමනළ කඳු වැටිය වියළි කලාපයේ පිහිටා ඇත ( )
7. වංගු සහිත මාර්ග කඳුකර භූ දර්ශනයේ විශේෂ ලක්ෂණයකි( )
8. වැව් විශාල ප්‍රමාණයක් වියළි කලාපයේ ඇත ( )
9. නිදහස් වෙළඳ කලාප තෙත් කලාපීය භූ දර්ශනයේ දක්නට ලැබේ( )
10. කරවල වේලීම කඳුකරයේ සිදු කරයි ( )

■ පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න

11. කඳුකර භූ දර්ශනයේ මානුෂ ක්‍රියාකාරකම් 3ක් ලියන්න
12. වියළි කලාපයට ආවේණික වූ ලක්ෂණ 2ක් ලියන්න
13.තෙත් කලාපීය භූමිය හානි වී ඇති අයුරු කෙටියෙන් පහදන්න
14.තෙත් කලාපීය ජනයා වගා කරන භෝග වර්ග 5ක් ලියන්න
15. යාපන අර්ධද්වීපය හා යාබද දූපත් ආශ්‍රිත ජනයා කරන රැකියාවන් 5 ක් ලියන්න
16. ඉහත ප්‍රදේශවල ජනයා තල් ගස ප්‍රයෝජනයට ගන්නා ආකාරය ලියන්න
17. වෙරළ කලාපයේ පවතින බොකු,කලපු, තුඩු, දූපත් 2 බැගින් ලියන්න
18. වෙරළ භූ දර්ශනය හානි වී ඇති ආකාර 2ක් ලියන්න
19.වෙරළ ආශ්‍රිත භූ දර්ශනයේ ඇති සංචාරක ස්ථාන 5ක් ලියන්න
20. වෙරළ ආශ්‍රිත භූ දර්ශනයේ ඇති කර්මාන්ත ලියන්න

## 4 පාඩම ස්වභාවික උපද්‍රව හා ආපදා

■ පහත ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න

1.ශ්‍රී ලංකාවේ නියඟ බලපාන දිස්ත්‍රික්ක දෙකක් ලෙස ............................. දැක්විය හැකිය

2.පහත් බිම් ගොඩ කිරීම ............................. ආපදාවට බලපාන හේතුවකි

3.නායයෑම් සඳහා බලපාන ස්වභාවික හේතුවක් වන්නේ.......................... යි

4. නායයෑම් සඳහා බ,පාන මානුෂ ක්‍රියාකාරකමක් වන්නේ ............................. යි

5.ශ්‍රී ලංකාවේ බොහෝ අකුණු ඇති වන මාස ලෙස ............................. හැකිය

6.අකුණු අනතුරු වළක්වා ගැනීමට නම් ............................. භාවිතා නොකළ යුතුය

7.මුහුද ගොඩ ගැලීම ............................. ආපදාවෙන් සිදුවන හානියකි

8.ගංවතුර ඇතිවන වියළි කලාපීය දිස්ත්‍රික්ක දෙකක් ලෙස ............................. දැක්විය හැකිය

9.මුහුදේ සිදුවන භූමිකම්පා .............................ආපදාව ඇති වීමට බලපාන හේතුවකි

10. ශ්‍රී ලංකාවේ නිරන්තරයෙන් ඇතිවන ආපදාවක් වන්නේ ............................. ආපදාවයි

■ පහත සඳහන් ප්‍රකාශ හරි නම් හරි ලකුණද වැරදි නම් වැරදි ලකුණද යොදන්න

11.අධික ඉන්ධන දහනය දේශගුණික වෙනස්වීම් ඇතිවීමට බලපාන හේතුවක ( )

12. යාපනය ගංවතුර ඇතිවන දිස්ත්‍රික්කයකි( )

13. සුනාමි යනු ජපන් භාෂාවෙන් බිඳී ආ වචනයකි ( )

14.සුනාමියකින් වැළකීම සඳහා උසින් වැඩි ආරක්ෂිත ස්ථාන කරා යා යුතුය( )

15.ආපදා තත්වයක් බවට පත් වී නොමති ස්වභාවික උපද්‍රවයක් වන්නේ නායයෑම් වේ( )

■ පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න

16. ගෝලීය දේශගුණ වෙනස්වීමක් යනු කුමක්දැයි ලියමින් එය ශ්‍රී ලංකාවට බලපාන අයුරු කෙටියෙන් විස්තර කරන්න

17. ආපදා චක්‍රය යනු කුමක්ද එය ඇඳ නම් කරන්න

18.භූමිකම්පාවක් මගින් මිනිසාට හා පරිසරයට වන හානි දෙක බැගින් ලියන්න

19.සුළි සුළඟක් යනු කුමක්ද එමගින් ඇතිවන හානි දෙකක් ලියන්න

20.නායයෑම් වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග 3ක් ලියන්න

## 5 පාඩම සිතියම් පරිහරණය

■ පහත ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න

1.සිතියම් පොතක් ඇසුරින් හඳුනා ගත හැකි සිතියම් මූලිකාංග ලෙස ............................, ............................, ............................, ............................, .............................. දැක්විය හැකිය

2.ශ්‍රී ලංකා සිතියම් සංග්‍රහය නම් සිතියම් පොතෙහි .............................., .............................. වැනි විවිධ සිතියම් වර්ග හඳුනාගත හැකිය

3. සිතියමක දිශා සටහනක් යොදා නොමැති අවස්ථාවලදී සිතියමේ මාතෘකාව දක්වා ඇති දිශාව .............................. දිශාව ලෙස හඳුනාගෙන අනෙකුත් දිශා හඳුනාගත හැකිය

4. 1:50000 සිතියම .............................. දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇත

5.සිතියම් පිටලස් කිරීමේදී .............................., .............................., .............................. යන ක්‍රම 3 භාවිතා කළ හැකිය

■ පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න

6.සිතියමක් කඩදාසියක පිටලස් කිරීමේදී අවශ්‍ය ද්‍රව්‍ය මොනවාද

7.එසේ පිටලස් කිරීමේදී අනුගමනය කළ යුතු පියවරයන් ලියන්න

8. 1:50000 යන්නෙහි අර්ථය පැහැදිළි කරන්න

9. ඔබ ශ්‍රී ලංකා සිතියමක දැක ඇති සංකේත 5ක් ඇඳ නම් කරන්න

10. සුචිය යනු කුමක්ද